ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව |
| දිනය | 2014. 09. 27 |

## ශ්‍රී ලංකා මහ බැංකුවට එරෙහිව ග්‍රීක බැඳුම්කර පෙත්සම විභාගයට ගැනීම ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රතික්ෂේප කරයි.

ග්‍රීක බැඳුම්කර මිල දී ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට එරෙහිව කොළඹ 03 හි පදිංචි සුජීව අර්ජුන සේනසිංහ මහතා විසින් ගොනු කරනු ලැබූ මූලික අයිතිවාසිකම් පෙත්සම 2014 සැප්තැම්බර් 18 වන දින ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නිෂ්ප්‍රභ කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව ග්‍රීක රජයේ බැඳුම්කර මිල දී ගැනීමේදී නීති විරෝධීව, වගකීම් විරහිතව සහ අත්තනෝමතිකව ක්‍රියා කර ඇති බවට මෙම මූලික අයිතිවාසිකම් පෙත්සම මගින් චෝදනා කර තිබිණි.

එම තීන්දුව ප්‍රකාශයට පත් කරමින් ශ්‍රේෂ්ඨාධිකරණය සඳහන් කර ඇත්තේ ග්‍රීක බැඳුම්කරවල සිදු කරන ලද ආයෝජනය මහ බැංකුවෙහි අවදානම් කළමනාකරණ උපාය මාර්ගයන්හි කොටසක් බවත්, සියලුම ආයෝජන කිසි අවදානමකින් තොර ආයෝජන ලෙස පවත්වාගෙන ගියහොත්, එහිදී ලැබෙන ප්‍රතිලාභ නොසැළකිය හැකි තරම් සුළු මට්ටමක පැවතිය හැකි බවත්ය. ඒ අනුව සැළකිය යුතු තරමේ ඉහළ ප්‍රතිලාභයක් ලබා ගැනීම සඳහා අඩු අවදානම් ඇති ආයෝජනවල මෙන්ම අවදානම් සහිත ආයෝජනවල මිශ්‍රණයක් තෝරා ගැනීමට මහ බැංකුවට සිදු වේ.

මෙම තීන්දුව ප්‍රකාශයට පත් කිරීමේදී අධිකරණය වැඩි දුරටත් සඳහන් කර ඇත්තේ සංකීර්ණ, ආර්ථික, ප්‍රතිපත්තිමය කරුණුවලදී සෑම තීරණයක්ම අනිවාර්යයෙන්ම ප්‍රායෝගික කරුණු සළකා බලා ගත යුතු වන බැවින් ඒවායේ වලංගුභාවය දැඩි ක්‍රමවේදයන් හෝ නිර්ණායක මගින් පරීක්ෂා කිරීම සාර්ථක නොවන බවය. එමෙන්ම අධිකරණය විසින් මහ බැංකු අධිපතිවරයාගේ හෝ මුදල් මණ්ඩල සාමාජිකයන්ගේ තීරණවල ව්‍යවස්ථානුකූල වලංගුභාවය නිශ්චය කිරීමේදී, ආර්ථික ක්‍රියාකාරකම්වල සංකීර්ණ ස්වභාවය සළකා තීරණ ගැනීමේ නිදහසක් තිබිය යුතු බව පෙන්වා දී ඇත. වෙනත් ප්‍රතිපත්තිමය තීරණයක් මෙම තීරණයට සාපේක්ෂව වඩාත් සාධාරණ බව, බුද්ධිමත් බව හෝ විද්‍යානුකූල බව, එසේත් නැත්නම් තාර්කික බව පෙනී ගිය පමණින්ම දැනට ගෙන ඇති තීරණයක් ප්‍රතික්ෂේප කිරීමට අධිකරණයට හැකියාවක් නොමැති බවත්, යම් තීරණයක් නිශ්චිත කාලයකදී හෝ නිශ්චිත අවස්ථාවකදී කොතරම් සුදුසු වූවාද යන්න පිළිබඳව තම මතය ප්‍රකාශ කිරීමට

අධිකරණය බලාපොරොත්තු නොවන අතර එම කාරණය අදාළ ආයතනයටම තීරණය කිරීමට ඉඩ දීම වඩාත් සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

අවදානම් සමපාත කිරීමේ අරමුණ පදනම් කරගනිමින් සහ ආයෝජන කළඹෙහි ඉතා සුළු ප්‍රමාණයකට අදාළව ඉහළ අවදානමක් දැරීමට මහ බැංකුවට ඇති හැකියාව අධිකරණයේ ඇගයීමට ලක් විය. (ග්‍රීක බැඳුම්කරවල ආයෝජනය කර ඇත්තේ ආයෝජන කළඹෙන් සියයට 0.6ක ප්‍රමාණයක් පමණි.) ඉහළ ප්‍රතිලාභ සහිත රාජ්‍ය ආයෝජන මූලාශ්‍රයන්හි ආයෝජනය කිරීම ලෝකයේ බොහෝ ආයෝජන අරමුදල්වල කළමණාකාරිත්වයන්ගේ ප්‍රධාන කාර්යයක් වන බවත්, ග්‍රීක රාජ්‍ය බැඳුම්කර වල තම සංචිතවලින් දරා ගත හැකි කොටසක් (0.6%) ආයෝජනය කිරීමේදී මහ බැංකුව ද අනුගමනය කර ඇත්තේ ඒ හා සමාන පිළිවෙතක් වන බවත් අධිකරණය තව දුරටත් සඳහන් කරන ලදී.

ආයෝජනයෙන් සති ගණනකට පසුව 2011 ජූලි මස මැදදී, යූරෝ කලාපයේ ආර්ථික තත්ත්වය අයහපත් වීමත් සමග, මහ බැංකුව විසින් ග්‍රීක බැඳුම්කරවලින් කොටසක් ඇමරිකානු ඩොලර් මිලියන 6.6ක පාඩුවක් ලබමින් අලෙවි කර ඇත. මෙම පියවර ගෙන ඇත්තේ යූරෝ කලාපයේ ආර්ථික තත්ත්වය තවදුරටත් අයහපත් වීමකින් ග්‍රීක ආයෝජනවලට අදාළව තව දුරටත් සිදු විය හැකිව තිබූ පාඩු වළක්වා ගැනීම සඳහාය. 2011 වසරේ උපයා ඇති ලාභ ප්‍රමාණය වන ඇමරිකානු ඩොලර් මිලියන 430.2 ගණනය කිරීමේදී ඉහත දක් වූ අලාභය ද සැළකිල්ලට ගෙන ඇති බව අධිකරණය විසින් ප්‍රකාශ කරන ලදී.

සියලු තත්ත්වයන් සළකා බැලීමෙන් අනතුරුව ග්‍රීක බැඳුම්කරවල ආයෝජනය කිරීමේ තීරණය ගැනීමේදී, මුදල් මණ්ඩලයේ සාමාජිකයන් අත්තනෝමතික, අසාධාරණ හෝ වංචනික ආකාරයකින් ක්‍රියා කර ඇති බව තීරණය කිරීමට කිසිදු හැකියාවක් හෝ පදනමක් නොමැති බව කේ. ශ්‍රී පවන් ප්‍රධාන විනිසුරුතුමන්, ආර්. මාරසිංහ විනිසුරුතුමිය සහ සරත් ද ආබෲ විනිසුරුතුමන්ගෙන් සමන්විත වූ ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල විසින් ඒකමතිකව තීරණය කර ඇත.

පෝල් රත්නායක ඇසෝසියේට්ස් හි උපදෙස් මත උපුල් ජයසූරිය සහ එස්. එච්. එම්. මොහෙමෙඩ් යන නීතිඥවරුන් පෙත්සම්කරු වෙනුවෙන් පෙනී සිටි අතර නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් සංජේ රාජරත්නම් සහ ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ සභීඩා බාරි මහත්මිය වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් පෙනී සිටියහ.